# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2411/03 - 2024 නොවැම්බර් මස 18 වැනි සඳුදා - 2024.11.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2022/23.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.11.29 වන දින අංක 2360/50 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.11.22 වැනි දින දරන නියෝගයෙන්,

ඩබ්. එම්. අශෝකා දමයන්ති කුමාරි මිය, පරිපාලන නිලධාරි (රා. ආ.), මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය, වැලිකන්ද.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර පවත්නා 2023.11.14 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ අමල් ඒ. රන්දෙනිය මහතා වෙත යොමු කරන ලදී.


1A - G 043066 - 14 (2024/11)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරු නීතිඥ අමල් ඒ. රන්දෙනිය මහතා මෙම ආරාවුලෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළ යුතු යැයි දැන් පෙනී යන හෙයින් අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2023.11.22 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය .

2024 නොවැම්බර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

EOG 11 - 0086/1

---

මගේ අංකය: IR/COM/03/2022/23.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

ඩබ්. එම්. අශෝකා දමයන්ති කුමාරි මිය, පරිපාලන නිලධාරි (රා. ආ.), මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය, වැලිකන්ද.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් සීදූව, ලියනගේමුල්ල, HPT ප්‍රධාන පාර, 31/1, සී. ඒ. එච්. එම්. විජේරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය .

2024 නොවැම්බර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2022/23.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඩබ්. එම්. අශෝකා දමයන්ති කුමාරි මිය, පරිපාලන නිලධාරි (රා. ආ.), මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය, වැලිකන්ද.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,**

"ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පරිපාලන නිලධාරි (රා. ආ.) ලෙස සේවය කරන ඩබ්. එම්. අශෝකා දමයන්ති කුමාරි මිය හට,

1. 2020.11.26 දින පැවති පරිපාලන නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය අනුව පරිපාලන නිලධාරි තනතුර සඳහා තේරීම් ලේඛනයේ නියමිත සුදුසුකම් සපුරා තිබුණේ ද යන්නත්,

2. එදින පැවති සම්මුඛ පරීක්ෂණය මත නියමිත තනතුර ලබා නොදී නැවත වසරකට පසුව පැවති සම්මුඛ පරීක්ෂණයේදී ඇයට අසාධාරණයක් සිදුව තිබේද යන්නත්,

එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳ වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ඔක්තෝබර් මස 29 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 - 0086/2

---

මගේ අංකය: IR/COM/03/2021/31.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

ඩබ්. ඒ. ප්‍රේමසිරි මයා, පලුගහවත්ත, ඉහල වීරකොඩියාන, වීරකොඩියාන.

සහ

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මත්තේගොඩ, කුඩාමාදුව, ද විලේජ්, අංක 202/බී/61, නීතිඥ විජේසූරිය ආරච්චිගේ ජයවික්‍රම මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය .

2024 නොවැම්බර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2021/31.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඩබ්. ඒ. ප්‍රේමසිරි මයා, පලුගහවත්ත, ඉහල වීරකොඩියාන, වීරකොඩියාන.

සහ

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,**

"ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කළ ඩබ්. ඒ. ප්‍රේමසිරි මහතා, වැඩ තහනමට ලක්ව සිටි කාලසීමාව සඳහා එනම් 1990.04.16 දින සිට 1991.04.19 දින දක්වා හා 2002.11.13 දින සිට 2006.09.18 දින දක්වා කාලසීමාවන් සඳහා ඔහුට හිඟ වැටුප් සඳහා හිමිකමක් තිබේද, හිමිකමක් තිබේ නම් එය නොගෙවීම මඟින් අසාධාරණයක් සිදුවී තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ඔක්තෝබර් මස 28 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 - 0087

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.